


# ඇඳිසි

ජගත් ජේ එදිරිසිංහ ලියයි

**"මං හූණා කිව්ව වගේ කියන්නං පුතයෝ.. මේකේ කෙළවරක කෙල්ලෙක් ඉන්නවා ඉන්නවා මයි.. අර ඔපිස් එකේ කෙල්ලට මේකේ සම්බන්දයක් නෑ නේද..?" ප්‍රඥාරත්න කොක් හඬ දී සිනාසෙයි. ".. දැං තමුසෙ කල්පනා කරන්නෙ මොකද්ද කියලා මං හරියටම කියන්ඩද..? මේ යකා කොහොමද මේවා දන්නෙ..? තමුසෙ හිතන්නෙ ඒකනේ.. අයිෂේ රණසිංහ.. ඕනෙම මන්ත්‍රී කෙනෙක් අද උදේ කෑවෙ මොනාද කියන්ඩත් මං දන්නවා.. ඔන්න තමුසෙගෙ මූණ කලු වුණා.. තරහා ගන්නඩ එපා අයිෂේ.. එහෙම නැතුව මේවා කරන්ඩ බෑ... කනවා කනවා මේ කෙසෙල් ගෙඩියක් වත්." ප්‍රඥාරත්න ගේ ඉඳුල් වතුර රැඳුණ අතින් දික්කරන කෙසෙල් ගෙඩිය රණසිංහ අතට ගන්නේ අප්පිරියාවෙනි.**

මිදුලේ කතුරුමුරුංගා ගසේ වසා සිටිය කාක්කා තෝරතෝංචියක් නැතිව කෑ ගසයි. ගලක් ගසා ඌ එලවා දමන්නට තරම් කේන්තියක් සුනන්දට දැනෙයි. සමුදරා නැන්දා සාදා ගෙනැවිත් තිබූ තේ කෝප්පය ඔහු ඉදිරියේ ටීපෝව මත තවමත් ඇත. දැන් නම් එය ඇල් වී ඇතුවා නිසැක ය. එය අතට ගෙන බොන්නට තරම් හිතක් ඔහුට නැත.

ඔහු යාබද පුටුව මත වූ පුවත්පත ගෙන කියවන්නට ගනියි. වචන පේලි ඔස්සේ ඇස් ගිය ද හිතට ආ කිසිවක් නැති බව ඔහුට දැනෙයි. නොසන්සුන් වූ සිතේ වෙනත් කිසිවක් නොරැඳෙයි. පුවත්පත නැවත පුටුව මත ම තබා ඔහු මිදුලට බසියි. දහවල් දැඩි හිරු රැසින් මිදුලේ බොරලු රත් වී ඇත. ඔහු සමර් හවුස් එක තුළ වූ ලී පුටුවේ වාඩි වෙයි. එතුළ සිසිලස ගතට සුවයකි.

"අයියෝ.. ඔයා මේ තේක බීලත් නෑ .." අයෝමා මිදුලට එන්නේ තේ කෝප්පයත් අතැතිව ය. ඇගේ තෙත කොණ්ඩය මත හිරු රැස් වැටී දිළිසෙණු ඔහුට පෙ
".. එක්කෝ ඉන්ඩ මං ආයෙ තේකක් 
එන්නං.. මේක හොඳටම නිව්ලා.."

"එපා.."

ඕ මිදුල මැද ම නැවතී ඔහු දෙස බල

"මොකද මේ..? ඔයා... තාම අප්සෙට් එකේ ද..?" ඕ සිනාසෙන්නට තැත් ක
තෙරුම් ගන්න ළමයෝ.. මට ඕනෙ වු
ඒ වැඩේ කෙරෙන විදිහකට කරන්න..
දන්නවා මම ම ගිහින් කිව්වාම රණසි
අයියා විශේෂ සැළකිල්ලකින් වැඩේ ස
බව.. අනික ඒ සිදුවීම් වලට අදාල ක
කාරණා දන්නෙත් මමනෙ.."

අයෝමා සුනන්ද ඉදිරියේ වූ පුටුවේ වාඩි වෙයි. ළැම හරහා දමා ගෙන සිටින තෙත කෙස් වැටියේ අගින් තවමත් වෑස්සෙන දිය බින්දු නිසා ඇගේ ගවොම මත තෙත පැල්ලමක් ඇඳී ඇති සැටි ඔහුට පෙනෙයි.

"මගේ ප්‍රශ්ණෙ ඔයා ගිය එක ගැන නෙවෙයි.. මට නොකියා ගිය එක ගැනයි.." ඔහු ගේ නෝක්කාඩු ස්වරය ඇගේ සිතේ ඇති කරන්නේ අසතුටකි.

"හැම පොඩි කාරණයක්ම ඔයාට කියලා කරන්න ඕනෙය කියලා මං හිතුවෙ නැහැ.. එහෙම බලාපොරොත්තු වෙන එකත් වැරදියිනෙ.. බොරුවට තරහා ගන්න එපා.. අපරාදෙ... තේරුමක් නෑ... තනියම හිතලා යමක් කරන්න තරම් බුද්ධියක් මට තියෙනවා කියලා මං හිතනවා.." ඇය පිටකරන්නේ සිතේ මතු වූ අප්‍රසාදයයි.

අධ්‍යාපනය විසින් ඇය තමාගෙන් ඈත් කරනු ලබමින් තිබේ ය යන හැඟීම වෙන කෙදිනකටවත් වඩා අද ඔහුට දැනෙමින් තිබෙයි. තමා නැවතී සිටියදී ඇය බොහෝ වේගයෙන් ඉදිරියට යමින් සිටින්නී ය යන්න අමිහිරි වුවද සත්‍යයක් බව ඔහු දනියි. තව මාස කීපයකින් ඇය උපාධිය සම්පූර්ණ කරනු ඇත. තමාගේ උගත් කමට සරිලන රැකියාවක් ඇය සොයාගනු ඇත. යන්තම් සාමාන්‍ය පෙළ සමත් වූ තමා ඇයට කෙසේ ගැලපෙනු ඇද්ද යන පැනයට නිසි පිළිතුරක් ඔහු ළඟ නැත.

"මං යන්නං.." ඔහු නැගිටියි.

"තරහින් නේද යන්න හදන්නෙ..?" ඕ සිනාසෙන්නට උත්සාහ කරයි. ".. කෑම කාලා යන්න.. අම්ම ඔයාටත් එක්ක උයනවා.."

"පස්සෙ දවසක එන්නං.. නැන්දට කියන්න මං ගියා කියලා.."

ඔහු පිලිබඳ හටගත් අනුකම්පාවකින් අයෝමාගේ සිත වැසී යයි. එහෙත් ඒ හැඟිම ඔහු ඉදිරියේ ප්‍රදර්ශණය කරන්නට ඇයට නොසිතෙයි. ඒ මන්දැයි තේරුම් ගන්නට ඇයටවත් නොහැකි ය.

ඔහු මෝටර් සයිකලය මත වාඩි වී ඇය දෙස හැරී බලයි. ඔහුගේ ඇස් වල ඇත්තේ තේරුම් ගත නොහැකි බැල්මක් යයි ඇයට සිතෙයි.

"පරිස්සමින් යන්න.." ඇය කියන්නේ පුරුද්දට ය.

"ගිහින් එන්නං..." ඔහු කියන්නේ ද පුරුද්දට ය.

0000000

"තමුසෙට පිස්සුද අයිසේ... මේ අහනවා රණසිංහ.." ප්‍රඥාරත්න මහත් රුචියකින් කමින් සිටි කුකුල් මස් කටුව දතින් හපා කැඩුවේ ය. ඔහුගේ කෑදර කෑම විලාසය බලා සිටිය නොහැකිව රණසිංහ බිම බලා ගත්තේ ය. ".. විශ්ව විද්‍යාල කොල්ලො පිකටිං කලා නං... තමං ඉගෙන ගන්න තැන බඩු මුට්ටු පොඩි පට්ටම් කලා නං... උගන්නන ගුරුවරුන්ට අඩංතේට්ටං කළා නං... උන්ට දඬුවමක් දෙන්ඩම ඕනේ.. එතකොට තමයි අනිත් උං පාඩමක් ඉගෙන ගන්නෙ.."

"ඇමති තුමා කියන කතාව ඇත්ත .. මාත් පිලිගන්නවා.. ඒත් මේ ළමයා අහිංසක ළමයෙක්.. නිරපරාදේ අහුවෙලා ඉන්නෙ.. මට කරන උදව්වක් හැටියට මේ වැඩේ ෂේප් කරලා දෙන්න.." රණසිංහ කියන්නේ ඔලුව උස්සා බලන අතරවාරයේදී ය. ඇමති තුමා හපා කෑ මස්කටු කුඩා කන්දක් මෙන් ඔහුගෙ පිඟානේ කෙළවරක ගොඩ ගැසී තිබෙණු රණසිංහ දකියි. "මළ පෙරේතයෙක්.." ඔහු සිත යටින් කියයි.

අත සෝදන බඳුණ ළං කර ගනිමින් ප්‍රඥාරත්න රණසිංහ දෙස බලන්නේ යටැසිනි.

"අයිෂේ අයිෂේ රණසිංහ.. තමුසේ තමයි පුතයා.. මං දන්නවා හොඳට තමුසේ ගැන.. තමුසෙට බෑ මට කොලේ වහන්ඩ... ඇත්ත කියනවා මට.. මොකද මේ හාදයා ගැන මේ තරං කැක්කුමක් තමුසෙට.. "

"මේ මං දන්න ළමයෙක් ඇමති තුමා.. දුප්පත් ළමයෙක්.. අධ්‍යාපනය කඩා කප්පල් වුණොත් අපරාදෙ.. ඒකයි.."

"මං හූණා කිව්ව වගේ කියන්නං පුතයෝ.. මේකේ කෙළවරක කෙල්ලෙක් ඉන්නවා ඉන්නවා මයි.. අර ඔපිස් එකේ කෙල්ලට මේකේ සම්බන්දයක් නෑ නේද..?" ප්‍රඥාරත්න කොක් හඬ දී සිනාසෙයි. ".. දැං තමුසෙ කල්පනා කරන්නෙ මොකද්ද කියලා මං හරියටම කියන්ඩද..? මේ යකා කොහොමද මේවා දන්නෙ..? තමුසෙ හිතන්නෙ ඒකනේ.. අයිෂේ රණසිංහ.. ඕනෙම මන්ත්‍රී කෙනෙක් අද උදේ කෑවෙ මොනාද කියන්ඩත් මං දන්නවා.. ඔන්න තමුසෙගෙ මූණ කලු වුණා.. තරහා ගන්නඩ එපා අයිෂේ.. එහෙම නැතුව මේවා කරන්ඩ බෑ... කනවා කනවා මේ කෙසෙල් ගෙඩියක් වත්." ප්‍රඥාරත්න ගේ ඉඳුල් වතුර රැඳුණ අතින් දික්කරන කෙසෙල් ගෙඩිය රණසිංහ අතට ගන්නේ අප්පිරියාවෙනි.

"හොඳ වෙලාවට කෙසෙල් ගෙඩියට ගලවලා දාන්න පුලුවන් ලෙල්ලක් තියෙන්නෙ.." ඔහු සිතයි.

"මං දැං යනවා.. තමුසෙ හදිස්සියක් නැතුව හෙමිහිට කෑම කාලා යනවා.." ප්‍රඥාරත්න මේසයෙන් නැගිටින අතර කියයි. ඔහු ගමන නවත්වා ආපසු හැරී රණසිංහ දෙස බලයි. ".. අයිෂේ.. මං තමුසෙගෙ වැඩේ කරලා දෙන්නං.. ඉතිං දැං තමුසෙ ගෙදර දුවන්ඩ හදන්ඩ එපා.. අද රෑට කුමාරදාස මුදලාලිගෙ ගෙදර පැදුරකුත් ලෑස්ති කරලා තියෙනවා කිව්වා.. මං කිව්වා තමුසෙත් එනවා කියලා.. පොඩ්ඩක් ඒකටත් ඔලුව දාලා සින්දුවක් කියලා පොඩි ජොලියක් දාලා යනවා.. තමුසෙ ඉතිං සින්දු කාරයානේ.. ඉඳල හිටලා බයිලත් කියනවා තමයි.. ඒකට ප්‍රශ්නයක් නෑ.." ප්‍රඥාරත්න අවසාන වාක්‍ය දෙක කියන්නේ මහ හඬින් සිනාසෙන අතර ය.

0000

සේවිකාව ගෙනැවිත් දුන් තේ කෝප්පය අතට ගත් සුනන්ද එය තමා ඉදිරියේ වූ ටීපෝව මත තබයි.

"උණු වැඩියි නේද..?" වින්ධ්‍යා සිනාසෙයි. ".. කුසුමා නොදන්නවට මං නං දන්නවා සුනන්දයියා උණුවෙන් තේ බොන්නැති විත්තිය.."

"උණුවෙන් බීල කට පුච්චගන්න ආස නැහැ මං.."

වින්ධ්‍යා තමා අත වු සඟරාව වසා දමයි. ඇය කල්පනාවකට වැටෙන සැටි සුනන්ද දකියි. මුහුණෙහි වූ සිනාව අතුරුදන්වී වන්නේ එනිසා ය.

"අනුන්ගෙ වැඩ වලට බළල් අතක් වෙලා අත පුච්ච ගන්න නම් දෙපාරක් හිතන්නෙ නැහැ නේද..?" වින්ධ්‍යා අසන්නේ බොහෝ වේලාවකට පසුව ය. ඇය කී දේ තේරුම් ගන්නට ඒ හැටි උත්සාහයක් ගත යුතු නැත. එනමුදු එය පෙන්වන්නට ඔහුට නොසිතෙයි.

"මට තේරුණේ නැහැ.."

වින්ධ්‍යා ඔහු දෙස බලන්නේ උපහාසය විසුලණ ඇසින් ය.

"වැඩි හිතවත් කමට.. එහෙමත් නැත්නම් හිත හොඳ කමට.. අනුන් වෙනුවෙන් ඕනෙ නැති වැඩ වලට අත දාන්නෙ ඇයි..? මං කියන්නෙ තේරුම් ගන්න අමාරු දෙයක් නෙවෙයි නේද..?"

"මං කෙනෙකුට හිතවත් නං ජීවිතේ හරි දෙන්න ලෑස්තිවෙලයි එහෙම කරන්නෙ.."

"ඒක හොඳ ගුණයක්.. ඒත් ප්‍රයෝජනයක් නැති කෙනෙක් වෙනුවෙන් ප්‍රයෝජනයක් ඇති ජීවිතයක් නාස්ති කරන එක අපරාදයක් සුනන්ද.. ජීවිතේ ගැන මෙයිට වඩා හිතන්න. " මිදුලේ වාහනයක් පණ ගන්වන හඬ ඇසෙයි. පොලිසියේ වාහනය විය යුතු ය. මේ මුරට සිටින පොලිස් භටයන් මාරු වන වේලාව ය. සුනන්ද වින්ධ්‍යා කී දේ නෑසුණා සේ පුටුවෙන් නැගිට දොර වෙත ඇවිද යයි. අලුතෙන් රාජකාරියට ආ පොලිස් භටයන්

26 වන පිටුවට